324409

28 JUN 2004
SRI LANKA

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1341/8 – 2004 මැයි 17 වැනි සඳුදා – 2004.05.17

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදි)

## I වැනි කොටස : (I) වැනි ඡේදය – සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී.–බී. 6/2001

**2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය**

**විධිමත් කිරීමේ පනත**

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත විධිමත් කිරීමේ පනතේ 78 වන වගන්තිය සමග කියවිය යුතු ඒ පනතේ 105 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් සාදන ලද රීති.

ලුතිනන් ජෙනරාල් ඩෙනිස් පෙරේරා,
සභාපති,
ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය.

2004 මාර්තු මස 31 වැනි දින,
කොළඹ දී ය.

**රීති**

1. මේ රීතිය 2004 රක්ෂණ නියෝජිතයන්ගේ සුදුසුකම් (සංශෝධන) රීතිය, යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. වර්ෂ 2002 සැප්තැම්බර් 23 අංක 1255/3 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2002 රක්ෂණ නියෝජිතයන්ගේ සුදුසුකම් රීතිවල 2(ඇ)(i) වන රීතියේ ඇති “සම්මාන” යන වචනය වෙනුවට “සාමාන්‍ය” යන වචනය ආදේශ කිරීමෙන් ඒ රීතිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

එල්.ඩී.–බී. 6/2001

**2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය**

**විධිමත් කිරීමේ පනත**

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත විධිමත් කිරීමේ පනතේ 26 වන වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 105 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් සාදන ලද රීති.

ලුතිනන් ජෙනරාල් ඩෙනිස් පෙරේරා,
සභාපති,
ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය.

2004 මාර්තු මස 31 වැනි දින,
කොළඹ දී ය.

1A – PG 000362 – 410 (2004/05)

## රීති

1. මේ රීති 2004 ණය ගෙවීමේ හැකියාවේ සීමා (සාමාන්‍ය රක්ෂණ) රීති යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) (මේ රීතිවල "රක්ෂණකරු" යනුවෙන් සඳහන් කරනු ලබන) සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය පවත්වාගෙන යන යම් රක්ෂණකරුවකු විසින් පවත්වාගෙන යාමට නියමිත වූ ද වත්කම්වල අගය සහ වගකීම්වල අගය අතර ඇති වෙනස වූ ද, ණය ගෙවීමේ හැකියාවේ සීමාවේ ප්‍රමාණය, පහත සඳහන් මුදල්වලින් උපරිම මුදලට වඩා අඩු නොවිය යුතු ය:–

(අ) රුපියල් මිලියන 50 ක්; හෝ

(ආ) ශුද්ධ වාරික මුදලින් 20% කට සමාන මුදලක්; හෝ

(ඇ) පවත්නා වර්ෂයට ඉහතින් ම වූ අවුරුදු තුනක කාලයක් සඳහා ගෙවීම හිඟ තබා ඇති ශුද්ධ හිමිකම්පෑම්වලින් 40% කට සමාන මුදලක්.

(2) (1) වන ඡේදයේ සඳහන් ණය ගෙවීමේ හැකියාවේ සීමාව වර්ෂය තුළ සියලු අවස්ථාවන්හි දී පවත්වාගෙන යා යුතු අතර මණ්ඩලයට අවශ්‍ය වන්නේ නම්, විගණකවරයා විසින් සහතික කරනු ලැබිය යුතු ය.

3. ණය ගෙවීමේ හැකියාවේ සීමාව තීරණය කිරීමේ කාර්ය සඳහා රක්ෂණකරුවකුගේ වගකීම්වල අගය විය යුත්තේ-

(අ) පහත සඳහන් දේ ඇතුළත් වන තාක්ෂණික සංචිතය, එනම්:

(i) 1/365 ක්‍රමයේ හෝ 1/24 ක්‍රමයේ පදනම මත ගණන් බලනු ලැබිය යුතු ශුද්ධ උපයනු නොලැබූ වාරික සංචිතය, සමුද්‍රීය නැව්බඩු රක්ෂණය සම්බන්ධයෙන් වන විට, 40% පදනම ද භාවිත කරනු ලැබිය හැකි ය;

කෙසේ වුව ද, වාර්ෂික නොවන ඔප්පු සඳහා රක්ෂණකරුවකු විසින්, මණ්ඩලයේ පූර්ව අනුමතිය ඇතිව, උපයනු නොලැබූ වාරික සංචිතය ගණන් බැලීම සඳහා වෙනත් යම් උචිත පදනමක් උපයෝගී කරගනු ලැබිය හැකි ය. ඉහත සඳහන් ක්‍රමවලින් යම් ක්‍රමයක් අනුගමනය කරමින් එසේ ගණන් බලනු ලැබූ උපයනු නොලැබූ වාරික සංචිතය, එම පදනම මතම ගණන් බලනු ලැබූ කල්තබන ලද අත්කර ගැනීමේ වියදම් සඳහා වෙනස් කරනු ලැබිය යුතු ය.

අනුගමනය කරන ලද්දේ කවර පදනමක් වුව ද එම පදනම, මූල්‍ය ප්‍රකාශවල සම්පූර්ණයෙන්ම හෙළිකරන බවට රක්ෂණකරු සහතික විය යුතු ය;

(ii) ශුද්ධ පදනමක් මත ගණන් බලනු ලැබූ අවසන් නොවූ අවදානම් සංචිතය;

(iii) ගෙවීම හිඟ තබා ඇති ශුද්ධ හිමිකම්පෑම් සඳහා සංචිතය;

(iv) ශුද්ධ පදනමක් මත ගණන් බලනු ලැබූ දරන ලද එහෙත් වාර්තා නොකරන ලද හිමිකම්පෑම් සංචිතය; සහ

(v) වෙනත් යම් අවිනිශ්චිත සංචිත.

(ආ) ශේෂ පත්‍රයේ පෙන්නුම් කර ඇති පරිදි වගකීම්; සහ

(ඇ) මණ්ඩලය විසින් දැනුම් දෙනු ලැබූ පරිදි වෙනත් යම් විශේෂ ස්වභාවයක වගකීම්

4. ණය ගෙවීමේ හැකියාවේ සීමා නිශ්චය කිරීමේ කාර්යය සඳහා, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ පහත දැක්වෙන වත්කම් වර්ගවල ප්‍රතිශතයන් හෝ මුදල් ප්‍රමාණයන් ද, ව්‍යවස්ථාපිත අවම කොටස් ප්‍රාග්ධන අවශ්‍යතාව සහ දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයේ ණය ගෙවීමේ අවශ්‍යතාවය සපුරාලීමෙන් පසු, දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයේ කොටස් හිමියන්ගේ අරමුදලේ යම් අතිරික්තයක් ද ආවේශ්‍ය කරනු ලබන ලෙස සලකනු ලැබිය යුතු ය:

(අ) ආණ්ඩුවේ සුරැකුම්පත් – 100%;

(ආ) රත්රන් – නියම මුදල;

(ඇ) බලපත්‍රලාභී ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක ලැයිස්තුගත කරන ලද සමාගමක ලැයිස්තුගත කරන ලද සාධන පත්‍ර 35%;

(ඈ) ලැයිස්තුගත කරන ලද හෝ බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හෝ බලපත්‍රලත් විශේෂිත බැංකුවක් විසින් නිකුත් කරනු ලබන ඇපයක් මගින් සනාථ කරන ලද, බැඳුම්කර, සෘණ පත්‍රය, වාණිජ පත්‍ර සහ වෙනත් සමාන මූල්‍ය සාධන පත්‍ර ඇතුළු සාංගමික ණය – 30%;

(ඉ) යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හෝ යම් බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් වෙත ඇති බැංකු තැන්පතු – 50%;

(ඊ) නිදහස් අයිතිය දරන හෝ බදු අයිතිය දරන ඉඩම් – 15%;

(උ) නිදහස් අයිතිය දරන හෝ බදු අයිතිය දරන ගොඩනැගිලි – 15%;

(ඌ) ඒකක භාර – 35%;

(එ) නිශ්චල දේපළ මත හිඟ උකස් ණය – 20%;

(ඒ) ප්‍රතිරක්ෂණකරුවන්ගෙන් හෝ පවරන සමාගම්වලින් අයවිය යුතු මුදල් – නියම මුදල;

(ඔ) හිඟ වාරික – නියම මුදල.

94461
25 AUG 2004
NATIONAL LIBRARY AND DOCUMENTATION CENTRE

5. (1) 4 වන රීතිය යටතේ ආවේශ්‍ය කළ හැකි වත්කම්වල අගය, පහත දැක්වෙන ආකාරයට නිශ්චය කරනු ලැබිය යුතු ය:-

(අ) ආණ්ඩුවේ සුරැකුම්පත්හි අගය කෙළින්ම ගණන් බැලීමේ ක්‍රමය හෝ නියත පළදා ක්‍රම යන දෙකෙන් එක් ක්‍රමයක් භාවිත කරමින් ක්‍රමානුකූල පදනමක් මත වෙන්කරන ලද වාරික හිලව් කිරීම හෝ වට්ටම් උපචයනය, කල්පිරීමේ දිනයට ගලපන ලද පරිදි පිරිවැය අගය

324409

28 JUN 2004



විය යුතු ය;

(ආ) පිරිවැයට හෝ වෙළඳපොළ අගය යන දෙකෙන් වඩා අඩු වටිනාකම අනුව රත්‍රන් තක්සේරු කරනු ලැබිය යුතු ය;

(ඇ) බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක ලැයිස්තුගත කොටස් පිරිවැයට හෝ වෙළඳපළ අගය යන දෙකෙන් වඩා අඩු වටිනාකම අනුව තක්සේරු කරනු ලැබිය යුතු ය;

(ඈ) ලැයිස්තුගත කරන ලද හෝ බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක්, මගින් නිකුත් කරනු ලබන ඇපයක් මගින් සහාය කරන ලද බැඳුම්කර, සෑණපත්‍ර, වාණිජ පත්‍ර සහ වෙනත් සමාන මූල්‍ය සාධන පත්‍ර ඇතුළු සාංගමික ණයවල වටිනාකම, කෙළින්ම ගණන් බැලීමේ ක්‍රමය හෝ නියත පළදා ක්‍රමය හෝ වෙළඳපල අගය යන දෙකෙන් වඩා අඩු අගය භාවිතා කරමින් ක්‍රමානුකූල පදනමක් මත වෙන්කර දෙන ලද වාරික හිලව් කිරීම හෝ වට්ටම් උපචයනය, කල්පිරීමේ දිනයට ගලපන ලද පරිදි ගත් පිරිවැය අගය විය යුතු ය;

(ඉ) යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් වෙත ඇති තැන්පතුවල අගය එම තැන්පතුවල ප්‍රකාශන අගයට උපචිත වන පොලිය එකතු කිරීමෙන් ලැබෙන අගය විය යුතු ය;

(ඊ) නිදහස් අයිතිය දරන හෝ බදු අයිතිය දරන ඉඩමක අගය පිරිවැය අගය හෝ මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබූ නියමු උපදෙස්වලට අනුකූලව මණ්ඩලය අනුමත කරන ලද තක්සේරුකරුවකු විසින් තීරණය කරනු ලබන ප්‍රතිතක්සේරු කරන ලද මුදල විය යුතු ය;

(උ) නිදහස් අයිතිය දරන හෝ බදු අයිතිය දරන ගොඩනැගිල්ලක අගය උපචිත ක්ෂයවීම අඩු කළ පසු ලැබෙන පිරිවැය අගය හෝ ප්‍රතිතක්සේරුවෙන් පසු උපචිත වූ ක්ෂය වූ මුදල අඩුකොට මණ්ඩලය විසින් නිකුත් කරන ලද නියමු උපදෙස්වලට අනුව මණ්ඩල අනුමත කරන ලද තක්සේරුකරුවකු විසින් තීරණය කරනු ලබන ප්‍රතිතක්සේරු කළ මුදල විය යුතු ය;

(ඌ) ඒකක භාරයක ඒකකවල අගය, පිරිවැය අගය හෝ කළමනාකරු විසින් මිලදී ගත් මිල යන දෙකෙන් වඩා අඩු වටිනාකම අනුව තක්සේරු කළ යුතු ය;

(එ) හිඟ උකස් ණයවල අගය, ප්‍රධාන ණය මුදල හෝ ණය මුදලින් අයකරගත හැකි ශුද්ධ අගය යන දෙකෙන් වඩා අඩු ප්‍රමාණය නොඉක්මවිය යුතු ය;

(ඒ) රඳවා තබාගෙන ඇති තැන්පතු ඇතුළු ප්‍රතිරක්ෂණකරුවකුගෙන් හෝ පවරන සමාගමකින් අයවිය යුතු මුදල්වල අගය,

බොල් සහ සැක සහිත ණය සඳහා ප්‍රතිපාදන අඩු කිරීමෙන් පසු අයවිය යුතු මුදල විය යුතුය; සහ

(ඔ) ප්‍රතිරක්ෂණකරුවකුගෙන් අයකරගත හැකි හිමිකම්පෑම්වල අගය බොල් සහ සැක සහිත ණය සඳහා ප්‍රතිපාදන අඩු කිරීමෙන් පසු ඉතිරි වන මුදල නොඉක්ම විය යුතු ය.

(2) මේ රීතිවල 1 (ඔ) ඡේදයේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද හිඟව ඇති ශේෂවල ගෙවිය යුතු දිනයේ සිට හය මාසයකට වැඩි කාලයක් සඳහා හිඟව ඇති සියලු ශේෂ සැක සහිත ණය මුදලක් ලෙස සැලකීමට රක්ෂණකරුවකු විසින් විධිවිධාන සැලකිය යුතු ය.

(3) ගෙවිය යුතු දිනයේ සිට මාස හයකට වැඩි කාලයක් හිඟව ඇති යම් මුදලක්, එම රක්ෂණකරුට අයවිය යුතු ආයෝජන ආදායමක් ලෙස ඔහු විසින් සලකනු නොලැබිය යුතු ය.

(4) නිශ්චය කිරීමේ ආකාරය මේ රීතියේ (1) වන ඡේදයේ විධිවිධාන සළසා නොමැති, නිදහස් අයිතිය හෝ බදු අයිතිය ඇති ඉඩම් සහ ගොඩනැගිලි ප්‍රතිතක්සේරු කිරීම සහ ආවේශ්‍ය කළ හැකි වත්කම් තක්සේරු කිරීම, ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතිවලට අනුකූලව කරනු ලැබිය යුතු ය.

6. 3 වන රීතියේ නියමයන්ට අනුකූලව ක්‍රියා නොකිරීම නිසා පැන නගින යම් ආරවුලකදී, එම රීතියේ සඳහන් වර්තමානයේ අදාළ වන නියම උපදෙස් වශයෙන් ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් සහතික කරනු ලබන නියම උපදෙස්වල පිටපතක් යම් අධිකරණයකදී සාක්ෂි වශයෙන් ආවේශ්‍ය කළ යුතු අතර එහි අන්තර්ගත කාරණා සම්බන්ධයෙන් බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

7. මේ රීති ක්‍රියාත්මක වීමේ දිනයේ දී, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය පවත්වාගෙන යන රක්ෂණකරුවකු විසින්, මේ රීතිවල විධිවිධාන සළසා ඇති ක්‍රමය හැර වෙනත් ක්‍රමයකට අනුකූලව තීරණය කරනු ලබන ණය ගෙවීමේ හැකියාවේ සීමාවේ මුදලක් පවත්වාගෙන යන අවස්ථාවක දී, මේ රීතිවලට පටහැනිව කුමක් සඳහන් වුව ද, එම රක්ෂණකරුට, මේ රීති ක්‍රියාත්මක වීමේ දින සිට අවුරුදු තුනක් නොඉක්මවන කාලයක් සඳහා එම ක්‍රමය දිගටම පවත්වාගෙන යාමට හිමිකම් ඇති අතර, ඉන්පසු මේ රීතිවල විධිවිධානවලට අනුකූලව ක්‍රියා කරනු ලැබිය යුතු ය.

8. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ රීතිවල–

"පනත" යන්නෙන් 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත අදහස් වේ;

"බලපත්‍රලාභී වාණිජ බැංකුව" සහ "බලපත්‍රලාභී විශේෂිත බැංකුව" යන්නට 1995 අංක 33 දරන පනත මගින් සංශෝධිත 1985 අංක 30 දරන බැංකු පනතෙහි ලබා දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය" යන්නෙන්, 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත යටතේ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් බලපත්‍ර දෙන ලද ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් අදහස් වේ;

"තාක්ෂණ සංචිතය" යන්නෙන් පනතේ 24 වන වගන්තිය යටතේ පවත්වාගෙන යනු ලබන තාක්ෂණික සංචිතය අදහස් වේ;

"ඒකක භාරය" යන්නෙන්, 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත යටතේ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් බලපත්‍රයක් ප්‍රදානය කර ඇත්තේ යම් කළමනාකරණ සමාගමකටද ඒ කළමනාකරණ සමාගමේ ඒකක භාරයක් අදහස් වන අතර එම ඒකක භාරය ඇතුළත් වේ.

06 - 02

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.